නිපුණතාව 7.0 -ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සංඛ්‍යාන නිමානය යොදා ගනියි.

නිපුණතා මට්ටම 7.9 - සංගහන දෙකක මධ්‍යන්‍යයන්ගේ අන්තරය සඳහා විශ්‍රම්භ ප්‍රාන්තර භාවිත කරයි.

1.)තොග වෙළෙන්දෙක් A හා B නිෂ්පාදන ආයතන දෙකෙන් එක්තරා නිෂ්පාදිතයක් මිලට ගනී.එම නිෂ්පාදන ආයතන දෙකෙන් 100 බැගින් වූ නියැදි ලබා ගත් විට එම නිෂ්පාදිතයේ මධ්‍යන්‍ය බර පිළිවෙලින් 110g හා 98 gක් ලෙස ලැබුණි.සම්මත අපගමන පිළිවෙලින් 4g හා 3.9gක් ලෙස ලැබුණි.තොග වෙළෙන්දාට 95%ක විශ්වාසයෙන් යුතුව සංගහනවල බරෙහි මධ්‍යන්‍ය අතර වෙනස සෙවීමට අවශ්‍යව ඇත.

- A හා B නිෂ්පාදිතවල බරෙහි සංගහන ව්‍යාප්ති කවරේද?
- A හා B නිෂ්පාදිතවල බරෙහි වෙනසේ නියැදුම් ව්‍යාප්තිය කුමක්ද?
- ඒ සඳහා යොදා ගත් උපකල්පන මොනවාද?
- සංගහන දෙකෙහි බර අතර අන්තරය ඇස්තමේන්තු කරන්න.

2.)තොග වෙළෙන්දෙක් A හා B ආයතන දෙකකින් විදුලි උපකරණ වර්ගයක් මිලට ගනී.ආයු කාලයන්හි සම්මත අපගමනය පැය 150ක් හා පැය 125ක් වේ.විදුලි උපකරණ 100 බැගින් වූ නියැදි ලබා ගෙන පරීක්ෂා කළ විට ඒවායෙහි මධ්‍යන්‍ය ආයුකාලයන් පැය 1500 හා 1450 ලෙස ලැබුණි.තොග වෙළෙන්දාට 99% විශ්වාසයෙන් යුතුව සංගහනවල ආයුකාලයන්හි මධ්‍යන්‍ය අතර වෙනස සෙවීමට අවශ්‍යව ඇත.

- A හා B විදුලි උපකරණවල ආයුකාලයන්හි සංගහන ව්‍යාප්ති දන්නේද?
- A හා B විදුලි උපකරණවල මධ්‍යන්‍ය ආයුකාල අතර වෙනසේ නියැදුම් ව්‍යාප්තිය කුමක්ද?ඒ සඳහා යොදාගත් උපකල්පන මොනවාද?
- 99% විශ්‍රම්භ මට්ටමට අදාළව වගු අගය ලබා ගන්න.
- සංගහන දෙකෙහි මධ්‍යන්‍ය ආයු කාල අතර අන්තරය ඇස්තමේන්තු කරන්න.